# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/13 – 2018 ජනවාරි 15 වැනි සඳුදා – 2018.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 06 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/69.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ඉ/3/1/2/15.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, මාවතගම.

2. **ඉඩමේ විස්තරය.–** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 699, මඩව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිලැස්ස ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයූ/එම්ඩබ්ලිව්ටී/2017/299 සහ 2017.09.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඩේසිමවුන්ට්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0405 ක් පමණ**

උතුරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ඩේසිමවුන්ට්වත්ත; නැගෙනහිරට: මාර්ගය; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: කේ. ඒ. පුෂ්පකාන්ති හිමිකම් කියන සමගි උයන.

02. **කැබලි අක්ෂර 'බී' – ඩේසිමවුන්ට්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0391 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: මාර්ගය; දකුණට: ඒ. ජී. ප්‍රියන්ත හිමිකම් කියන ඩේසිමවුන්ට්වත්ත; බටහිරට: කේ. ඒ. පුෂ්පකාන්ති හිමිකම් කියන සමගි උයන.

02 – 17